# කොළඹ විශ්වවිද්‍යාලය

## ශ්‍රී පාලි මණ්ඩපය

## ජනමාධ්‍ය අධ්‍යයන අංශය

# ජනමාධ්‍ය අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PG Dip.) සහ ජනමාධ්‍ය අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MMS)

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ජනමාධ්‍ය උපාධි පිරිනමන අධ්‍යයන අයතනයයි. මෙම මණ්ඩපය විසින් ආරම්භ කිරීමට නියමිත ඉහත සඳහන් උපාධි පාඨමාලා සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලා දකුණු ආසියානු කලාපයේ ජනමාධ්‍ය පර්යේෂණ ආයතනවල සහයෝගිතාවයෙන් කොළඹ 03 කොළඹ විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පැවැත්වීමට නියමිතය.

ප්‍රවේශ සුදුසුකම්:

i. ජනමාධ්‍ය හෝ ඊට සම්බන්ධ විෂය ක්ෂේත්‍රයක් පිළිබඳව පිළිගත් විශ්වවිද්‍යාලයකින් / පිළිගත් ආයතනයකින් ලබාගත් පංති සාමාර්ථයක් සහිත උපාධියක් හෝ

ii. ජනමාධ්‍ය හෝ ඊට සම්බන්ධ ක්ෂේත්‍රයක් පිළිබඳව පිළිගත් විශ්වවිද්‍යාලයකින් / පිලිගත් ආයතනයකින් ලබාගත් උපාධියක් සහ පිළිගත් ආයතනයක වසර තුනක (03) සේවා පළපුරුද්ද හෝ

iii. පිළිගත් විශ්වවිද්‍යාලයකින් / පිළිගත් ආයතනයකින් ඕනෑම විෂයය ක්ෂේත්‍රයකින් ලබාගත් උපාධියක් සහ පිළිගත් ආයතනයක වසර පහක (05) ක අඛණ්ඩ සේවා පළපුරුද්ද

iv. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජනමාධ්‍ය විෂය ක්ෂේත්‍රයෙන් ලබාගත් එක් අවුරුදු ඩිප්ලෝමාව සහ පිළිගත් ජාතික ආයතනයක ජනමාධ්‍ය / සන්නිවේදනය / ප්‍රවෘත්ති / තොරතුරු / දැන්වීම්කරණ / අලෙවිකරණ / මහජන සම්බන්ධතා අංශයකට සම්බන්ධ එම ක්ෂේත්‍රයේ වෘත්තියක වසර අටක (08) අඛණ්ඩ සේවා පළපුරුද්ද හෝ

v. පිළිගත් ජාතික ජනමාධ්‍ය ආයතනයක වසර දොළහක (12) අඛණ්ඩ සේවා පළපුරුද්දක් සහිත සහ ඔහුට / ඇයට පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීමට ශක්‍යතාවක් ඇතැයි ඔහු දැනට සේවය කරන ජනමාධ්‍ය ආයතනයේ ප්‍රධානියාගේ නිර්දේශය

- මෙම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන අතර තෝරාගන්නා උපාධි අපේක්ෂකයින්ගෙන් ඉහළ ඉංග්‍රීසි සහ පරිගණක සාක්ෂරතාවක් අපේක්ෂා කෙරේ.

- ඉල්ලුම්පත්‍රය සහ වැඩි විස්තර http://www.cmb.ac.lk/academic/sripalee/index/index.htm වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

- සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර අධ්‍යාපන සහතිකවල සහ සේවා සහතිකවල පිටපත්, ලංකා බැංකුවේ අංක 0008049142 දරන ගිණුමේ තැන්පත් කරනු ලැබූ රු 1500/- ක ඉල්ලුම්පත්‍ර ගාස්තුවට අදළ රිසිට්පත ද සමඟ 2012 ජනවාරි මස 09 දින හෝ ඊට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, වැවල, හොරණ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ශ්‍රී පාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය
වැවල - හොරණ

දුරකථන : 0342261371
ඊමේල් : sripalee@spc.cmb.ac.lk
වෙබ් අඩවිය : http://www.cmb.ac.lk/academic/sripalee/index/index.htm

කොළඹ විශ්වවිද්‍යාලය
ශ්‍රී පාලි මණ්ඩපය
ජනමාධ්‍ය අධ්‍යයන අංශය

<u>**ගුවන් විදුලි සහ රූපවාහිනී ජනමාධ්‍යවේදය පිළිබඳ ඩිප්ලෝමාව**</u>

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ජනමාධ්‍ය උපාධි අධ්‍යයන ආයතනයයි. ශ්‍රී පාලි මණ්ඩපය විසින් ආරම්භ කිරීමට නියමිත එක් අවුරුදු ගුවන්විදුලි සහ රූපවාහිනී ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.
මෙම ඩිප්ලෝමා පාඨමාලාව ශ්‍රී පාලි මණ්ඩපයේ පිහිටුවා ඇති නවීනතම අංග සම්පූර්ණ ගුවන්විදුලි සහ රූපවාහිනී මැදිරි සංකීර්ණයේදී මුළුමනින්ම ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් ලෙස පැවැත්වේ.
ප්‍රවේශ සුදුසුකම් :
අ.පො.ස (උසස්පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින් සමත්වීම හෝ කොළඹ විශ්වවිද්‍යාලය විසින් පිළිගන්නා ඊට සමාන සුදුසුකමක්.

පාඨමාලා ගාස්තු : රු 50000 /- කි. (කොටස් වශයෙන් ගෙවීමේ පහසුකම් සලසනු ලැබේ.)
ඉලලුම්පත්‍රය http://www.cmb.ac.lk/academic/sripalee/index/index.htm වෙබ් අඩවියෙන් ලබාගත හැකිය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ලංකා බැංකුවේ අංක 0008049142 දරන ගිණුමේ තැන්පත් කරනු ලැබූ රු 200 /- ක ඉල්ලුම්පත්‍ර ගාස්තුවට අදාළ රිසිට්පත ද සමඟ 2012.01.15 දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, වැවල, හොරණ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ශ්‍රී පාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය
වැවල - හොරණ

දුරකථන : 0342261371
ඊමේල් : sripalee@spc.cmb.ac.lk
වෙබ් අඩවිය : http://www.cmb.ac.lk/academic/sripalee/index/index.htm